# මී පැංචා සහ චීස් බෝලය



රිවිදුනි සෙනායා රුද්‍රිගු

# මී පැංචා සහ චීස් බෝලය

**රිවිදුනි සෙනායා රුද්‍රිගු**

කතෘ

පළමු දිගහැරීම

මහ/මහාමායා බාලිකා විද්‍යාලය
2-A

**ISBN 978-624-210-709-7**

# පිදුම

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ 2-A
පන්තියේ පන්තිභාර ගයත්‍රි සෙනවිරත්න
ගුරුතුමිය, සියලුම යෙහෙළියන්
හා දෙමාපියන්ට......



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරියුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත් කරන ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකි වීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ක පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධන වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන් වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායබාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇත හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර􀀀 එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එසී. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස් අනිවාර්ය ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026-05-10



ඔන්න එකමත් එක රටක මී අම්මෙකුයි, මී පුතෙකුයි හිටියා. මේ මී අම්මයි, මී පුතයි නගරේ ගෙදරක මී ගුලක තමයි ජීවත් වුණේ.

දවසක් මී අම්මයි, මී පුතයි කෑම හොයන්න කියලා හිතාගෙන මී ගුලෙන් එළියට ආවා. මේ දෙන්නා මිදුලේ ටිකක් එහෙට මෙහෙට ඇවිදලා කෑම හෙව්වා. එදා පෝය දවසක් නිසා හඳත් ලස්සනට රවුමට කහ පාටට පායලා තිබුණා. මී පැංචා කලින් හඳ දැකලා තිබුණේ නෑ.







මී පැංචා මී අම්මගෙන් හඳ පෙන්නලා ඇහුවා, අම්මේ, අම්මේ, මොකක්ද අර අහසේ කහ පාටට බෝලයක් තියෙන්නේ කියලා.



මී අම්මා මී පැංචට කිව්වා, පුතේ ඔය කහ පාට රවුම් චීස් බෝලයක් කියලා. මී පැංචට ඒක අහල හරිම සතුටුයි. එදා දවසේ මී අම්මයි මී පැංචයි කෑම හොයාගෙන කාලා ගුලට ඇවිත් නිදාගත්තා.



එදා රෑ මී පැංචා චීස් බෝලේ හීනෙනුත් දැක්කා.






පිහුවදා රෑ මී පැංචා අම්මටත් නොකියා චීස් බෝලේ කන්න කියලා හිතාගෙන ගුලෙන් එළියට බැස්සා. ඔහොම යන අතරේ මී පැංචා දැක්කා උසම උස ගොඩනැගිල්ලක්. මී පැංචා ඒ ගොඩනැගිල්ලේ උඩටම නැග්ගා.

උඩටම නැග්ගට පස්සේ එයා දැක්කා කහ පාට රවුම් කේක් එකක් මේසයක් උඩ තියලා තියෙනවා කියලා.







මී පැංචා කේක් එකෙන් බාගයක්ම කෑවා. ඉන් පස්සේ එයා සද්ද නැතිව ගෙදර ඇවිත් සතුටින් නිදා ගත්තා.



ඔහොම දවස් කීපයක් ගතවුණා. ආයෙත් දවසක් රෑ මී අම්මයි, මී පැංචයි කෑම හොයන්න මී ගුලෙන් පිටත් වුණා. ඔහොම යන අතරේ මී පැංචා දැක්කා හඳෙන් භාගයක් පායලා තියෙනවා. දැන් පෝයත් පහුවෙලා දවස් කිහිපයක් ගිහින්.



මේ අතරේ මී පැංචා මී අම්මට කතා කරලා හඬ පෙන්නලා ඇහුවා අම්මේ අම්මේ අම්මා දන්නවද චීස් බෝලේ අනිත් භාගෙට මොකද වුනේ කියලා. මී පැංචා කිව්වා මම තමා දවසක් අනිත් බාගේ ඔක්කොම කෑවෙ කියලා.

මී අම්මට ඒක අහලා හිනා ගියා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි.ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසායි.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

9 786242 107097